| **08** | **ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වීම්** | | **1,039,670,221.51** | **958,023,775.55** |
| | | | | |
| **09** | **පාරිතෝෂික සඳහා වෙන්කිරීම්** | | **237,238,674.17** | **102,648,570.43** |
| | | | **5,932,036,809.60** | **5,239,917,354.86** |

NPCG/JF/D/UOJ/1/2024 2025 ජුනි 30 දින

උපකුලපතිතුමා,
යාපනය විශ්වවිද්‍යාලය

**යාපනය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යාපනය විශ්වවිද්‍යාලයේ (“**විශ්වවිද්‍යාලය**”) 2024 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල්

ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.26,678,265 ක පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ට අනුව ආදායම ලෙස හඳුනා නොගෙන සීමා කරන ලද අරමුදල් ගිණුමට බැර කර තිබුණි. එමනිසා, සමාලෝචිත වර්ෂය සඳහා සීමා කරන ලද අරමුදල සහ අතිරික්තය පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ස්වයං මූල්‍යන පාඨමාලා සහ ව්‍යාපෘතිවලින් ලැබුණු රු.27,018,953 ක ශුද්ධ ආදායම, ආදායම් ලෙස හඳුනා ගැනීම වෙනුවට, ජංගම වගකීම්වලට බැර කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් සහ අතිරික්තය පිළිවෙලින් එම මුදලින් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය වෙනුවෙන් 2024 වර්ෂයේදී වැය කරන ලද රු.4,536,095 ක මුදල ප්‍රාග්ධනිත කර අස්පෘශ්‍ය වත්කම් ලෙස දැක්වීම වෙනුවට නොනිමි වැඩ ලෙස වර්ගීකරණය කර දක්වා තිබුණි.

(ඈ) 2015 වර්ෂයේ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, යෞවන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ ගොවිපළ සහ පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාකාරකම් සඳහා පරිත්‍යාග කරන ලද පුලියන්කුලමේ පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල මෙම වාර්තාවේ දිනය වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිට ම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින්වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | *නීති, රීති හා රෙගුලාසි වලට යොමුව* | *නිරීක්ෂණය* |
|---|---|---|
| (*අ*) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහාවන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.3,240,859,349 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (*ආ*) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 2/15015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පවත්වා මාස 3ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලයේ පීඨ 12ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මාස 04 සිට මාස 30 දක්වා කාලයක් ගත වී තිබුණි. |

| | *නීති, රීති හා රෙගුලාසි වලට යොමුව* | *නිරීක්ෂණය* |
|---|---|---|
| (ඇ) | 2013 අප්‍රේල් 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2013 දරන ආයතන චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධනය කරන ලද ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 3 වගන්තිය. | සමාලෝචිත වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ස්ථාන 98 ක වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තාව, මෙම වාර්තාවේ දිනයවන විටත් අවසන් කර නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2022 ජනවාරි මස 3 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2022 හි 4 ඡේදය | නිසි තොග පාලනය සහ වත්කම් වගවීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල විසින් පුස්තකාල පොත් සහ වාර සඟරා සත්‍යාපනය සම්පූර්ණ කළ යුතුය. කෙසේ වෙතත්, පසුගිය වසර 5 තුළ යාපනය විශ්වවිද්‍යාල පුස්තකාලයේ, පුස්තකාල පොත් සහ වාර සඟරාවල තොග සත්‍යාපනය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

(*අ*) වෙළෙඳ ලැබිය යුතු දෑ ලෙස දක්වා ඇති එකතුව රු.5,130,148 ක මුදල වසර 05 සිට 06 දක්වා අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2024 දෙසැම්බර් මස 31 දිනට හිඟ ලෙස දක්වා තිබුණි.

(*ආ*) ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය හැත්තෑ නවයක් (79) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල විසිඑකක් (21) එම වැඩසටහන අවසන් කර වාර්තා කර නොතිබුණි. කෙසේ වෙතත්, 1980 සිට 2024 දක්වා කාලය තුළ ගිවිසුම් කඩ කළ නිලධාරින්ගෙන් අයකළ යුතු රු.87,196,060 ක වටිනාකමකින් යුත් බැඳුම්කර අයකර ගැනීමට විශ්වවිද්‍යාලය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(*ඇ*) ඉංජිනේරු තාක්ෂණය සහ පද්ධති තාක්ෂණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2021 දෙසැම්බර් මස 15 වැනි දින රු.432,400,031 ක කොන්ත්‍රාත් වටිනාකමකින් යුත් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. ගිවිසුමට අනුව ඉදිකිරීම් 2023 දෙසැම්බර් මස 31 දින වනවිට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් වැඩවලින් සියයට 48 ක් පමණක් 2025 අප්‍රේල් මස 21 වැනි දින දක්වා නිම කර තිබුණු අතර ඒ වනවිට රු.337,983,931 ක් ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය.

(*ඈ*) පසුගිය වසර 3 සිට 5 දක්වා කාලය තුළ පොත් සහ වාර සඟරා සැපයීම සඳහා සැපයුම්කරුවන් 5 දෙනෙකු වෙත රු.7,488,500 ක මුළු අත්තිකාරම් මුදලක් ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ පොත් සහ වාර සඟරා සපයා නොතිබූ අතර අත්තිකාරම් අයකර ගැනීමට ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(*ඉ*) විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර 2019 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

ජී.එච්.ඩී. ධර්මපාල,
විගණකාධිපති (*වැඩබලන*).

**1.2 සුදුසුකම් ලත් මතය සඳහා පදනම**

(අ) 2024 වර්ෂය සඳහා ආදායම මූල්‍ය වාර්තා තුළ නිවැරදිව සටහන් කර නිසි ලෙස ගිණුම්ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල 20 සටහනේ හෙළිදරව් කර ඇති පරිදි, සියලුම ආදායම් නිවැරදිව විස්තර කර ඇත. කෙසේ වෙතත්, මුද්‍රණ දෝෂයක් හේතුවෙන්, ආදායම් ප්‍රකාශනය තුළ ආදායම ඉදිරිපත් කිරීමේදී විෂමතා හඳුනාගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා සුදුසු ජර්නල් සටහන් හරහා මෙම විෂමතා වහාම නිවැරදි කර ඇත.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය සඳහා භාවිතා කරන ලද මෘදුකාංගයට අදාළ රු. 4,536,095 ක මුදල මුලින්, සිදුවෙමින් පවතින පුනරුත්ථාපන කටයුතු යටතේ වර්ගීකරණය කරන ලදී. මන්ද වත්කම තවමත් විශ්වවිද්‍යාලය පුරා එහි අපේක්ෂිත භාවිතය සඳහා සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වනබව නොසැලකේ. පෙර වාර්තාකරණ කාල සීමාව තුළ අදාළ සියලුම ක්ෂේත්‍ර හරහා සම්පූර්ණ ක්‍රියාත්මක කිරීම තවමත් සිදුවෙමින් පැවතුනි. පද්ධතිය 2014 සිට ක්‍රියාකාරීව භාවිතයේ පැවතුන ද, අවසාන ගෙවීම සිදු කරන ලද්දේ 2023 දී පමණක්වන අතර, මෙහෙයුම් අවශ්‍යතා සම්පූර්ණයෙන්ම සපුරාලීම සඳහා 2024 තුළ වෙනස් කිරීම් සහ වැඩිදියුණු කිරීම් සිදුවෙමින් පැවතුනි.

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, අස්පෘශ්‍ය වත්කමක ප්‍රාග්ධනීකරණය සිදුවන්නේ, එම වත්කම අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය තත්ත්වය තුළ භාවිතයට ගත හැකි වූ විටය. සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් පෙර වසරෙන් ඔබ්බට සිදු වූ බැවින්, එම අදියරේ දී වත්කම ප්‍රාග්ධනීකරණ නිර්ණායක සපුරා නොමැති බව තක්සේරු කරන ලදී.

විගණනයේ පිළිගැනීමට ප්‍රතිචාර වශයෙන්, 2025 වර්ෂයේ දී ජර්නල් සටහනක් හරහා එම අගය වත්කම් (මෘදුකාංග) වෙත මාරු කර ඇත. මෙම ගැලපීම මගින් මෘදුකාංගයේ නිසි වර්ගීකරණය සහතික කරන අතර නිවැරදි වත්කම් වාර්තා කිරීම ඉදිරියට ගෙන යාම සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

2025 දී වත්කම ප්‍රාග්ධනීකරණය කිරීමෙන් පසු, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය (SLPSAS) 07: දේපළ, පිරියත සහ උපකරණ අනුව එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත පදනම් ව ක්ෂයවීම ගණනය කෙරේ. SLPSAS 07 හි අවශ්‍යතාවලට අනුකූලව, ප්‍රාග්ධනීකරණය කළ දින සිට ක්ෂයවීම හඳුනා ගනු ලැබේ.

(ඇ) පුලියන්කුලම් ඒකාබද්ධ ගොවිපල සහ පුහුණු මධ්‍යස්ථානයේ කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම්, ප්‍රතිපත්ති සැලසුම්, ආර්ථික කටයුතු, ළමා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයට හිමිකාරිත්වය විධිමත් ලෙස පැවරීමකින් තොරව ලබා දෙන ලදී. පැහැදිලි හිමිකාරිත්ව හිමිකමක් නොමැතිව මූල්‍ය ප්‍රකාශනවල මෙම වත්කම් හඳුනා ගැනීම සැලකිය යුතු කනස්සල්ලක් ඇති කරයි.

නිල වශයෙන් භාරදීමේ ක්‍රියාවලිය තවමත් සිදුවෙමින් පවතින අතර, අදාළ දෙපාර්තමේන්තුව විසින් නිසි ලියකියවිලි සහ කවුන්සිලයට වාර්තා කිරීම බලාපොරොත්තුවෙන් සිටී. මෙම විධිමත් කටයුතු සම්පූර්ණ කර නිසි ලෙස වාර්තා කළ පසු, වත්කම් විශ්වවිද්‍යාලයට අයත් බව නිවැරදිව පිළිගනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වත්කම් හිමිකාරිත්වයේ විනිවිදභාවය පවත්වා ගැනීමට නිසි නීතිමය සහ පරිපාලන ක්‍රියා පටිපාටි අනුගමනය කරන බව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, හිමිකාරිත්වය පැවරීම අවසන් කර නිල වශයෙන් ලේඛනගත කරන තුරු, මෙම වත්කම් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල පිළිගත යුතු නොවේ.

**2.2.2. රීති සහ රෙගුලාසි වෙත යොමු කිරීම**

(අ) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනවලට අත්සන් නොකිරීම සිරිතකි. 2012 සැප්තැම්බර් මස 29 දින පැවති කවුන්සිලයේ 372 රැස්වීමේ දී මෙම පිළිවෙත විධිමත් ලෙස පිළිගනු ලැබූ අතර, අධ්‍යයන කාර්ය මණ්ඩලය එවැනි ලේඛනවලට අත්සන් කිරීමට කිසිදු අපේක්ෂාවක් නොමැති බව අවධාරණය කරන ලදී. පීඨ පීඨාධිපතිවරුන් අතර ඇති එකඟතාවයෙන් මෙම ස්ථාවරය තවදුරටත් සනාථ විය.

ඒ වෙනුවට, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ පැමිණීම නිරීක්ෂණය කිරීම සාම්ප්‍රදායිකව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සිදු කර ඇත. 2017 නොවැම්බර් මස 11 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා (COPE) රැස්වීමේ දී පැවති සාකච්ඡාවල දී මෙම ප්‍රොටෝකෝලය නැවත තහවුරු කරන ලද අතර, එහිදී ලබා දී ඇති පැහැදිලි කිරීම පිළිගනු ලැබීය.

(ආ) විභාග ප්‍රතිඵල කාලෝචිත ලෙස නිකුත් කිරීම සහතික කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත. ප්‍රතිඵල නිකුත් කිරීමේ තත්ත්වය, පැවති දිනයන් සහ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින විෂයයන් වැනි විභාග විස්තර ඇතුළුව, ඕනෑම ප්‍රමාදයක කාලසීමාව විස්තර කරන මාසික වාර්තා ඉතා සූක්ෂම ලෙස සම්පාදනය කර සෙනෙට් සභාවට ඉදිරිපත් කරනු ලැබේ.

තවද, 2020.03.04 දින නිසි බලධාරියා විසින් අනුමත කරන ලද සහ පසුව සභාවට වාර්තා කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛයක්, ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අරමුණු කරගත් අවශ්‍ය ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සහ රෙගුලාසි දක්වා ඇත. මෙම ක්‍රියාවලිය පිළිබඳ සුපරීක්ෂාකාරී අධීක්ෂණය සඳහා උත්සාහයන් යොමු කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරවලට සාපේක්ෂව ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්යක්ෂමතාවයේ සැලකිය යුතු වැඩි දියුණුවක් ඇති වී තිබේ.

මෙම උත්සාහයන් තවදුරටත් ආයතනිකකරණය කිරීම සඳහා, ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා කාලරාමු විභාග අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කර ඇති අතර, කවුන්සිලයේ අනුමැතිය ලැබෙන තෙක් මෙම ක්‍රියාශීලී පියවර වගකීම ශක්තිමත් කිරීමට සහ ප්‍රතිඵල ප්‍රකාශනය සඳහා ස්ථාපිත කාලරාමුවලට අනුකූල වීම සහතික කිරීමට අදහස් කෙරේ. ඊට අමතරව, සිසුන් ඔවුන්ගේ අදාළ වැඩසටහන්වල නියමිත කාල සීමාව තුළ උපාධිය ලබා ගැනීම සහතික කෙරේ (සාමාන්‍ය උපාධි සඳහා වසර 3 ක්, විශේෂ උපාධි සඳහා වසර 4 ක් සහ MBBS වැඩසටහන සඳහා වසර 5 ක්)

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ ආයතන චක්‍රලේඛ ලිපිය අංක 04/2023 ට අනුව, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා ඊළඟ වසරේ මාර්තු මස 17 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත යොමු කළ යුතුය. මෙම නියෝගයට අනුකූලව, සමීක්ෂණ මණ්ඩල කමිටු කාලෝචිත ආකාරයකින් පත් කරන ලද අතර, නියමිත කාල සීමාව තුළ සමීක්ෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අදාළ සියලුම ඒකක වෙත අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලදී.

කෙසේ වෙතත්, මුළු ස්ථාන 192 න්, 2025.07.21 වනවිට ස්ථාන 5 කට ඔවුන්ගේ වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි විය. මෙම ප්‍රමාදයට ප්‍රධාන හේතුව වූයේ වසරේ පළමු කාර්තුව බොහෝ පීඨවල ප්‍රධාන විභාග කාලය සමඟ සමපාත වීමයි. සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ලෙස සහ භාණ්ඩවල භාරකරුවන් ලෙස සමීක්ෂණ මණ්ඩලයට සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙම කාලය තුළ විභාග ආශ්‍රිත රාජකාරිවල ද නිරත විය. මෙම සට්ටනය සමහර ස්ථානවල සමීක්ෂණ වාර්තා පැවැත්වීම සහ අවසන් කිරීම ප්‍රමාද වීමට හේතු විය.

ප්‍රමාදය ගැන අපි කනගාටුවන අතර සමීක්ෂණ මණ්ඩල වාර්තා කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීමේ වැදගත්කම අපි පිළිගනිමු. සියලුම ස්ථානවල 2024 සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු අවසන් කර ඇති බවත්, සියලුම වාර්තා ජාතික විගණනයට ඉදිරිපත් කර ඇති බවත් තහවුරු කිරීමට අපි සතුටු වෙමු. අනාගතයේ දී එවැනි ප්‍රමාදයන් වැළැක්වීම සඳහා, වැඩිදියුණු කළ කාලසටහන්ගත කිරීම සහ විභාග රාජකාරි සමඟ ඇති විය හැකි ගැටුම් අවම කිරීම සඳහා කලින් සැලසුම් කිරීම ඇතුළු පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.

(ඈ) 2019.12.31 දක්වා මූල්‍ය වර්ෂය සඳහා පුස්තකාල පොත් සහ වාර සඟරා සත්‍යාපනය සාර්ථකව සිදු කර ඇති අතර 2020 දී පහත සඳහන් ස්ථානවල සම්පූර්ණ කර ඇත:

අ. ප්‍රධාන පුස්තකාලය
ආ. වෛද්‍ය පීඨ පුස්තකාලය
ඇ. සිද්ධ වෛද්‍ය පීඨ පුස්තකාලය
ඈ. එස්පීආර්පීඑෆ්වීඒ( SPRPFVA) පුස්තකාලය
ඉ. ඉංජිනේරු පීඨ පුස්තකාලය
ඊ. කෘෂිකර්ම පීඨ පුස්තකාලය
උ. තාක්ෂණ පීඨ පුස්තකාලය

එමෙන්ම, පුස්තකාලය 2025 වර්ෂයේ දී පුස්තකාල පොත් සහ වාර සඟරා සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී.

**2.3** වෙනත් කරුණු

(අ) රු. 5,130,148 ක හිඟ මුදල් පහත සඳහන් ලැබිය යුතු මුදල් පිළිබිඹු කරයි.

මානව ප්‍රාග්ධන සංවර්ධනය 429,486
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් 4,700,662

වාර්තාකරණ රාමුව තුළ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් අනෙකුත් ස්පර්ශ්‍ය වත්කම් හෙළිදරව් කිරීමට තීරණය කර ඇත. මානව ප්‍රාග්ධන සංවර්ධනය ද ස්පර්ශ්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කර ඇත, මන්ද එය මානව ප්‍රාග්ධන සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා යොදාගෙන ඇත. මෙම වර්ගීකරණය පිළිබිඹු කිරීම සඳහා ක්‍රියාමාර්ග 2025 මූල්‍ය වර්ෂයේ දී ක්‍රියාත්මක කෙරේ.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් පියවීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා, යාපනය විශ්ව විද්‍යාලය ලැබිය යුතු මුදල් පියවීමේ ක්‍රියාවලිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සන්නිවේදනය ආරම්භ කර ඇත. අමාත්‍යාංශයෙන් අරමුදල් ලැබුණු පසු, ලැබිය යුතු මුදල් කඩිනමින් පියවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) බැඳුම්කර සහ ශිෂ්‍යත්ව බැඳීම් පිළිබඳ කමිටුව (COBA) බැඳුම්කර පැහැර හරින්නන්ගේ විස්තර ඉතා උනන්දුවෙන් පරීක්ෂා කර පුළුල් ප්‍රතිපත්ති පත්‍රිකාවක් සම්පාදනය කර ඇත. පවතින නීතිමය සහ නියාමන රාමුව මෙන්ම 2017 දක්වා විශ්වවිද්‍යාල කවුන්සිලයේ අදාළ තීන්දු සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිපත්ති පත්‍රිකාව ඉතා සූක්ෂම ලෙස සකස් කරන ලදී. පසුව, 2018.02.24 දින කැඳවන ලද එහි 426 වන රැස්වීමේදී, කවුන්සිලය බැඳුම්කර බැඳීම් පිළිබඳ ප්‍රතිපත්ති පත්‍රිකාව අනුමත කළ අතර යාපනය විශ්වවිද්‍යාලයේ පරිපාලන රාමුව තුළ එය ක්‍රියාත්මක කිරීම සඳහා අවසරය ලබා දුන්නේය.

2018 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විවිධ විශ්වවිද්‍යාලවල පුද්ගලයින් ඇතුළත් පැහැර හැරීම්කරුවන්ගේ නම් පුවත්පත් හරහා ප්‍රසිද්ධියට පත් කළේය. වර්තමානයේ, පවතින එකම පිළියම වන්නේ දිගුකාලීන නොගෙවූ වගකීම සඳහා නීතිමය පිළියම් සෙවීම බැවින් වාර්තා වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා 2022.12.31 වන විට පැහැර හැරීම් 72 දෙනෙකුට අදාළ තොරතුරු සහ විස්තර පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ.

2022.04.20 දින පැවති එහි 16 වැනි රැස්වීමේ දී, COBA විසින් අධ්‍යයන සහ අනධ්‍යයන යන දෙඅංශයෙන් ම බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් රුපියල් මිලියන 68 ක මුළු හිඟ මුදල් ප්‍රමාණයක් දක්වා ඇත. ඊට ප්‍රතිචාර වශයෙන්, කමිටුවක් සකස් කර කවුන්සිලය විසින් නිසි ලෙස අනුමත කරන ලද දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් සාරාංශ ප්‍රතිපත්තියක්, මාර්ගෝපදේශයක් සහ ක්‍රියා පටිපාටි රාමුවක් සකස් කරන ලදී. විය හැකි නීතිමය ක්‍රියාමාර්ග සඳහා කවුන්සිලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සෑම නඩුවක්ම සූක්ෂම ලෙස පරීක්ෂා කරනු ලැබේ. දිගුකාලීන හිඟ ශේෂයන් ආමන්ත්‍රණය කිරීමේ අරමුණින් ගැඹුරු ඇගයීම් සිදු කිරීම සඳහා කමිටුව නිතිපතා රැස්වේ.

තවද, නියමිත අධ්‍යයන නිවාඩු කාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ නොකර රාජකාරි ආරම්භ කළ අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් COBA විසින් කරුණු ආමන්ත්‍රණය කර ඇත. 2022.04.20 දින පැවති 16 වැනි රැස්වීමේ දී පැවති සාකච්ඡා මත පදනම්ව සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කවුන්සිලයට ඉදිරිපත් කරන ලදී.

පැහැර හරින ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය 87 දෙනාගෙන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය 19 දෙනෙකු අතරින් හත් දෙනෙකු සම්බන්ධයෙන් කමිටුව තීරණ කිහිපයක් විස්තර කර ඇත:

i. බැඳුම්කර උල්ලංඝනය කරන්නෙකු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වුවහොත්, කාරණය සාකච්ඡා කිරීම සඳහා කවුන්සිලයට යොමු කරනු ලැබේ.

ii. ඇවර කරන ලද හානි සහ පොළිය යටතේ දැනටමත් කර ඇති ගෙවීම් සැලකිල්ලට ගනිමින් ඉතිරි වගකීම නිදහස් කළ හැකිය.

iii. කවුන්සිලයේ අනුමැතියට යටත්ව, පැහැර හරින ලද අය විසින් උකස් කරන ලද බැඳුම්කර දේපල හරහා හිඟ වගකීම ආපසු අයකර ගත හැකිය.

iv. පැහැර හරින අයට සහ ඔවුන්ගේ ඇපකරුවන්ට අවසාන අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කරනු ලබන අතර, නීතිමය මාර්ගයක් හරහා විදේශ ගමන් බලපත්‍ර රාජසන්තක කළ හැකිය.

v. පැහැර හරින අයට වසර දෙකක කාලයක් තුළ වාරික ගෙවීම් හරහා හිඟ බැඳුම්කර වගකීම පියවීමට අවසර ඇත. ගෙවීම් කාලසටහනට අනුකූල වීමට අපොහොසත් වීම, නීතිමය මාර්ග හරහා විදේශ ගමන් බලපත්‍ර රාජසන්තක කිරීමට හේතු විය හැකි අතර, පසුව ඉඩම් අයිතිය විශ්වවිද්‍යාලයට පැවරීම අරමුණු කරගත් නීතිමය ක්‍රියාමාර්ග ගතහැකිය.

**බැඳුම්කර අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග :**

හිඟ බැඳුම්කර බැඳීම් අයකර ගැනීම වේගවත් කිරීමේ උත්සාහයක් ලෙස, පහත සඳහන් උපායමාර්ගික පියවර ක්‍රියාත්මක කර ඇත:

1. **විධිමත් මතක් කිරීම් නිකුත් කිරීම**

සියලුම බැඳුම්කර පැහැර හැරෙන්නන්ට සහ ඔවුන්ගේ ඇපකරුවන්ට විධිමත් මතක් කිරීමේ ලිපි යවා ඇති අතර, ඔවුන්ගේ බැඳීම් පියවීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කෙරේ. ඕනෑම විධිමත් ඉල්ලුම් ලිපි නිකුත් කිරීමට පෙර මෙම සන්නිවේදනයන් බෙදා හරින ලදී.

2. **පීඨ මට්ටමේ සහභාගීත්වය**

කෘෂිකර්ම, වෛද්‍ය, විද්‍යා සහ කලා පීඨවල පීඨාධිපතිවරුන් සමඟ ඉලක්කගත රැස්වීම් පවත්වන ලදී. මෙම සැසිවල අරමුණ වූයේ ඔවුන්ගේ අදාළ පීඨවලට අනුබද්ධ පැහැර හැරෙන්නන් පිළිබඳ පුළුල් දත්ත රැස් කිරීමයි. පැහැර හැරෙන්නන් සොයා ගැනීමට සහ ඔවුන්ගේ අනුකූලතාව දිරිමත් කිරීමට, පවතින පුද්ගලික සහ වෘත්තීය සබඳතා උත්තේජනය කිරීමට පීඨ සහාය ක්‍රියාකාරීව අපේක්ෂා කරන ලදී.

3. **තහනම් කිරීමේ පියවර**

හඳුනාගත් සියලුම බැඳුම්කර පැහැර හැරෙන්නන් විශ්වවිද්‍යාල අනුග්‍රහය ලත් සංගම්වලට සහභාගී වීමෙන් විධිමත් ලෙස තහනම් කර ඇති අතර හමුවීම් සඳහා සුදුසුකම් නොලබයි. මෙම පියවර, නීති විරෝධී ක්‍රියාවන්හි බරපතලකම අවධාරණය කිරීම සහ වැළැක්වීමේ මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි.

4. **තොරතුරු ලබා ගැනීමේ කමිටුවක් පිහිටුවීම**

පැහැරහරින්නන් පිළිබඳ අදාළ තොරතුරු සොයා ගැනීමට සහ රැස් කිරීමට සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත මාර්ගගත සෙවුම් කමිටුවක් ස්ථාපිත කර ඇත. පැහැර හැරීම් සිදු කරන පුද්ගලයින් හඳුනා ගැනීමට සහ සම්බන්ධ කර ගැනීමට සහාය වීම සඳහා කමිටුව ඩිජිටල් මෙවලම් සහ සම්පත් භාවිතා කරයි.

බැඳුම්කර පැහැර හරින්නන් පිළිබඳ විස්තර සහ හිඟ මුදල් ප්‍රමාණයන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

| *පැහැර හරින්නන්ගේ කාණ්ඩ* | *විස්තර* | *ගණන* |
|---|---|---|
| 1 | දිගුකාලීන බැඳුම්කර පැහැර හැරීම්වල මුළු සංඛ්‍යාව* | 52 |
| | *මෙම පැහැර හරින්නන්ගේ කාණ්ඩය තුළ නඩු සම්පූර්ණයෙන්ම විසඳා ඇත. | 11 |
| | * මෙම කාණ්ඩය තුළ අයකර ගැනීම සිදුවෙමින් පවතී | 01 |
| 2 | පශ්චාත් උපාධි වැඩසටහන සම්පූර්ණ නොකර රාජකාරියට වාර්තා කළ පැහැර හරින අය: මාසික වාරික පදනම මත ඔවුන්ගේ වැටුපෙන් සෘජුවම අයකර ගැනීම සිදුවෙමින් පවතී. | 04 |
| 3 | 2020 න් පසු වාර්තා කරන ලද පැහැර හරින ලද අයකර ගැනීම් ක්‍රියාවලියේ පවතී. | 17 |
| 4 | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා නීති කටයුතු කමිටුවට භාර දුන් ලිපිගොනු | 03 |
| **එකතුව** | | **88** |

**<u>බැඳුම්කර පැහැර හැරීමේ කාණ්ඩ.</u>**

බැඳුම්කර පැහැර හැරීමේ පුද්ගලයින් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කර ඇති අතර පැහැර හැරීමේ පුද්ගලයින්ගේ ප්‍රමාණය පහත පරිදි සාරාංශ කර ඇත.

1. 1980 සිට 2016 දක්වා පැහැර හැරීමේ පුද්ගලයින්.
2. පශ්චාත් උපාධි වැඩසටහන සම්පූර්ණ නොකර රාජකාරියට වාර්තා කරන ලද පැහැර හැරීමේ පුද්ගලයින් - අයකර ගැනීම සිදුවෙමින් පවතී. (වාරික පදනම)
3. 2020 සිට 2024 දක්වා වාර්තා කරන ලද පැහැර හැරීමේ පුද්ගලයින් - අයකර ගැනීම සිදුවෙමින් පවතී (වාරික පදනම)

| *පැහැර හරින්න-න්ගේ කාණ්ඩ* | *පැහැර හරින්නන්ගේ තත්ත්වය* | *නඩු වාර්තා කළ කාල සීමාව* | *පැහැර හරින්නන් සංඛ්‍යාව* | *මුළු බැඳුම්කර මුදල රු. ශත* | ***2025.06.30*** *දිනට අයකරගත් මුදල රු. ශත* | *ශේෂ මුදල රු. ශත* | *වාර්තා කරන ලද කාලය - මුදා හැරීමේ / අයකර ගැනීමේ* |
|---|---|---|---|---|---|---|---|
| 1 | දිගුකාලීන බැඳුම්කර පැහැර හැරීම්වල මුළු සංඛ්‍යාව | 1980 සිට 2016 | 52 | 50,411,711.99 | 5,266,986.18 | 45,144,725.81 | - |
| | * මෙම පැහැර හරින්නන්ගේ කාණ්ඩය තුළ නඩු සම්පූර්ණයෙන්ම විසඳා ඇත | | 11 | 10,999,405.70 | 10,999,405.70 | 0.00 | 2023 සිට 2025 |
| | * මෙම කාණ්ඩය තුළ අයකර ගැනීම සිදුවෙමින් පවතී | | 01 | 1,022,637.10 | 496,915.11 | 525,721.99 | 2025 |
| 2 | පශ්චාත් උපාධි වැඩසටහන සම්පූර්ණ නොකර රාජකාරියට වාර්තා කළ පැහැර හරින අය: ඔවුන්ගේ වැටුපෙන් ඍජුවම මාසික වාරික පදනම මත අයකර ගැනීම සිදුවෙමින් පවතී. | 2008 සිට 2020 | 04 | 8,694,757.94 | 3,020,430.79 | 5,674,327.15 | 2023 සිට 2025 |
| 3 | 2020 න් පසු වාර්තා කරන ලද පැහැර හරින ලද අයකර ගැනීම් සිදුවෙමින් පවතී. | 2020 සිට 2024 | 17 | 166,707,631.63 | 74,843,801.71 | 91,863,829.92 | 2022 සිට 2025 |
| | * මෙම ණය පැහැර හරින්නන්ගේ කාණ්ඩය තුළ 2020 න් පසු නඩු සම්පූර්ණයෙන්ම විසඳා ඇත. | | 03 | 17,416,898.81 | 17,416,898.81 | 0.00 | 2025 |
| **එකතුව** | | | **88** | **255,253,043.17** | **112,044,438.30** | **143,208,604.87** | |

(*ඈ*) ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදයට හේතු පහත පරිදි වේ:

i. ආරම්භයේ දී, ස්ථාන ආශ්‍රිත ගැටළු කිහිපයක් සහ අයහපත් කාලගුණික තත්ත්වයන් කැණීම් සහ අත්තිවාරම් කටයුතු සඳහා බලපෑවේ, විශේෂයෙන් ඉහළ භූගත ජල මට්ටමක් හේතුවෙන්.

ii. ආර්ථික අර්බුදය, "අරගලය" විරෝධතා සහ රට මුහුණ දුන් ඉන්ධන අර්බුදය හේතුවෙන් උග්‍ර වූ ඉදිකිරීම් ද්‍රව්‍යවල දැඩි හිඟයක් සහ සැලකිය යුතු ප්‍රවාහන දුෂ්කරතා ඇති විය. මීට අමතරව, මෙම තත්වයන් හේතුවෙන්, කිලිනොච්චියේ අරිවියල් නගර් හි (ප්‍රධාන යාපනය විශ්වවිද්‍යාල මණ්ඩපයේ සිට කිලෝමීටර 80 ක් පමණ දුරින් පිහිටි දුරස්ථ ස්ථානයක්) දේශීය නේවාසික ශ්‍රම බලකාය ක්ෂය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර, විදුලිය සහ ප්‍රවාහන හිඟයයි.

iii. නිම කරන ලද වැඩ සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රගති හිමිකම් පියවීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් ඇති විය. ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්තුවට සහතික කර උපකුලපතිවරයා විසින් නිර්දේශ කර අදාළ අරමුදල් ඒජන්සිය වෙත යොමු කර තිබියදීත්, නියමිත කාල සීමාව තුළ කිසිදු ප්‍රගති හිමිකම් පියවා නොමැත. මෙම ප්‍රමාදයන් ව්‍යාපෘති නිම කිරීමේ සමස්ත ප්‍රමාදයට දායක විය.

iv. යාපනය විශ්වවිද්‍යාලය මුලින් අපේක්ෂා කළේ 2023 ජුනි මාසය වන විට ව්‍යාපෘතියේ දෙවන අදියර අවසන් කිරීමටයි. මෙම අපේක්ෂාව සැලකිල්ලට ගනිමින්, විශ්වවිද්‍යාලය තාක්ෂණ පීඨයට සිසුන් බඳවා ගැනීම වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තියට අනුකූල විය. වර්තමානයේ, සෑම අධ්‍යයන වර්ෂයකම සිසුන් 400 ක් පමණ ඇතුළත් කර ගනු ලබන නමුත්, පවතින ගොඩනැගිලි පහසුකම් මෙම වැඩි වූ බඳවා ගැනීම් සඳහා ප්‍රමාණවත් නොවේ. මෙම තත්ත්වය අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මක භාවයට තර්ජනයක් වන අතර ශිෂ්‍ය නොසන්සුන්තාවයට හේතු විය හැක. ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති වියදම් නොකළ අරමුදල් අධ්‍යාපන අමාත්‍යාංශයට හරවා යවා වැඩ කටයුතු කරගෙන යාමට සහ සම්පූර්ණ කිරීමට උපකාර කරන ලෙස යාපනය විශ්වවිද්‍යාලය ඉල්ලා ඇත. විශ්වවිද්‍යාලය දැනටමත් අදාළ සියලු පාර්ශවයන් සමඟ මෙම ගැටලුව මතු කර ඇත.

v. දැන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ උත්සාහයන්ට අනුව, ගරු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් අංක 24/1151/607/102 දරන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. 2024.07.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, රු. ශ්‍රී ලංකා රජය (GOSL) විසින් තාක්ෂණික පීඨ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනවලින් ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු. 395,000,000 ක් අනුමත කරන ලදී

vi. සේවායෝජකයා (උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය) සහ කොන්ත්‍රාත්කරු (ෆෝකස් මාර්කටින් සහ ඉංජිනේරු සමාගම (පුද්ගලික) සමාගම)අරමුදල් වෙන් කිරීම වර්තමාන අවශ්‍යතා සහ තත්වයන්ට ගැලපෙන පරිදි පෙර ගිවිසුම වෙනස් කර ඇති අතර, සංශෝධිත ගිවිසුමක් යටතේ වැඩ නැවත ආරම්භ කර ඇත.

vii. වර්තමාන සංශෝධිත ගිවිසුම මඟින් ඉදිකිරීම් කටයුතු 2025 ජූලි දක්වා කරගෙන යාමට ඉඩ සලසයි. මෙම ගිවිසුම අවසන් වූ පසු, මෙම තෙමහල් ගොඩනැගිල්ලේ (බිම් + පළමු + දෙවන මහල) දෙවන මහලේ ස්ලැබ් එක දක්වා සහ ඇතුළුව සියලුම ව්‍යුහාත්මක කටයුතු අවසන් කිරීමට අපි අපේක්ෂා කරමු. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම ගොඩනැගිල්ලේ බිම් මහල"ඇටසැකිලි ව්‍යුහයක්"(Skeleton Structure) වනු ඇත. අපි ක්‍රියාකාරකම් වැඩසටහන හොඳින් නිරීක්ෂණය කරන්නෙමු.

viii. 2025 අප්‍රේල් 21 වන විට, දෙවන අදියරෙන් 48% ක් අවසන් කර ඇති අතර, සංශෝධිත ගිවිසුම යටතේ වැඩවලින් 75% ක් අවසන් කර ඇත. ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය දැන් ලබාගෙන ඇති අතර, ඇස්තමේන්තු සකස් කිරීම දැනට සිදුවෙමින් පවතී.

(*ඇ)* වාර සඟරා සහ සඟරා සඳහා නොගෙවූ අත්තිකාරම් ගෙවීම් පිළිබඳ ඔබේ විමසුමට ප්‍රතිචාර වශයෙන්, අපගේ විදේශීය සහ දේශීය සැපයුම්කරුවන්ගෙන් ලැබුණු පිළිතුරු මත පදනම්ව පහත පැහැදිලි කිරීම ලබා දීමට අපි කැමැත්තෙමු:

**<u>කොන්සෝටියම් පොත් පුද්ගලික සමාගම (විදේශ සැපයුම්කරු):</u>**

විශේෂයෙන් පශ්චාත් COVID කාල පරිච්ඡේදය තුළ ප්‍රකාශකයින් විසින් සේවා ප්‍රමාදයන් හේතුවෙන් බොහෝ සැපයීම් සපයා නොමැති බව ඔවුන් ප්‍රකාශ කළහ. සැපයුම්කරු විසින් සපයනු නොලැබූ වාර සඟරා බහුතරයක් සඳහා ණය සටහනක් නිකුත් කළ අතර ණය සටහන යටතේ ආවරණය නොවන ඉතිරි සඟරා හැකි ඉක්මනින් සපයන බව ප්‍රකාශ කළේය.

<u>නීති ප්‍රකාශකයින් (විදේශ සැපයුම්කරු):</u>

ඔවුන්ගේ ප්‍රතිචාරයට අනුව, සපයනු නොලැබූ සඟරා බොහොමයක් COVID-19 කාල පරිච්ඡේදයට අදාළ වන අතර, එම කාලය තුළ බොහෝ සඟරා ප්‍රකාශයට පත් කර නොමැත. අපේක්ෂිත සඟරා නැවත මුද්‍රණය කරන බවට ප්‍රකාශකයින්ගෙන් සැපයුම්කරුට දැන් තහවුරු කිරීමක් ලැබී ඇත. මාසය අවසන් වන විට සම්පූර්ණ සැපයුම සම්පූර්ණ කරන බවට හෝ සපයා නොමැති ඕනෑම ජර්නලයක් සඳහා ණය සටහනක් නිකුත් කරන බවට ඔවුන් අපට සහතික විය.

<u>ග්ලෝබ් ප්‍රකාශකයින් (විදේශ සැපයුම්කරු):</u>

ඔවුන් සඳහන් කළේ:

(i) සමහර කලාප 2020 දී අපට තැපෑලෙන් යවන ලද නමුත් දැන් හිමිකම් කාලය ඉක්මවා ඇති අතර තොග තවදුරටත් ලබා ගත නොහැක.

(ii) ඇණවුම් කරන ලද දායකත්ව "මාර්ගගතව පමණි" එබැවින් ඇතැම් හිමිකම් වලංගු නොවේ.

(iii) නිශ්චිත සඟරාවක මගහැරුණු කලාප සඳහා මුදල් ආපසු ගෙවීමක් සකසා ඇති අතර, ඒ සඳහා ණය සටහනක් නිකුත් කර ඇත. එම ණය සටහන් විස්තර වන්නේ,

නිකුතුවේ මාතෘකාව – විද්‍යාව
අංක- GPCN2320006
දිනය – 2023.04.26
මුදල – ඇමරිකානු ඩොලර් 2431.00

(iv) 2020 සඳහා ආදේශන නිකුතු නොමැත; කෙසේ වෙතත්, 2022 කලාප කිහිපයක් ආදේශකයක් ලෙස යවනු ලැබේ.

(v) ප්‍රකාශකයින් අර්ධ වශයෙන් ඉටු කිරීම සඳහා විස්තර සපයා ඇති අතර පවතින කලාප යැවීම සඳහා ලිපිනය තහවුරු කිරීම ඉල්ලා ඇත.

ඔවුන්ගේ ප්‍රතිචාරයට අනුව, බොහෝ සඟරා ප්‍රකාශයට පත් නොකළ COVID-19 කාලපරිච්ඡේදයට අදාළ වන අතර, එම කාලය තුළ බොහෝ සඟරා ප්‍රකාශයට පත් කර නොමැත. මගහැරුණු සඟරා නිකුතු සඳහා ණය සටහනක් නිකුත් කරන ලදී. බැර කළ වටිනාකමට ආදේශකයක් ලෙස නව සඟරා සඳහා මාර්ගගත ප්‍රවේශය ලබා දීමට සැපයුම්කරු දැන් කැපවී සිටී.

<u>එක්ස්ප්‍රෝග්‍රැපික් පොත් පුද්ගලික සමාගම (දේශීය සැපයුම්කරු):</u>

සැපයූ සඟරා සඳහා අත්තිකාරම් ගෙවීම ආපසු ගෙවීම සඳහා අපගේ විධිමත් ලිපියට ප්‍රතිචාර වශයෙන්, එක්ස්ප්‍රෝග්‍රැපික් පොත් පුද්ගලික සමාගම 2022 වසර සඳහා හිඟ වාර සඟරා ලබා දීම සඳහා දීර්ඝ කිරීමක් ඉල්ලා ඇත. බොහෝ වාර සඟරා ලබා දී ඇත. කෙසේ වෙතත්, නිකුතු පහක් තවමත් ඉතිරිව ඇති අතර, එහි වටිනාකම රුපියල් 234,233.33 කි. සැපයුම්කරු මෙය පිළිගෙන බෙදා හැරීම සහතික කර ඇත.

විදේශ සැපයුම්කරුවන්ගේ ප්‍රමාදයන් සහ අර්ධ ප්‍රතිචාර මෙන්ම දේශීය සැපයුම්කරු සමඟ අඛණ්ඩව සිදුවන සන්නිවේදනය හේතුවෙන්, අපට දැනට අත්තිකාරම් පියවීමට නොහැකි වී තිබේ. අපේක්ෂිත ගැටළු ආපසු ගෙවීම් හෝ ණයපත් හරහා සැපයීම හෝ විසඳීම සහතික කිරීමට උත්සාහයන් අඛණ්ඩව සිදුවෙමින් පවතී. ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ අවශ්‍ය අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අපි සියලුම සැපයුම්කරුවන් සමඟ ක්‍රියාකාරීව පසු විපරම් කරමින් සිටිමු.

කාරණය විසඳුණු පසු අත්තිකාරම් කඩිනමින් පියවීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවත්, නිසි විසඳුමක් සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි නීතිමය සහාය ලබා ගන්නා බවත් අපි ඔබට සහතික වෙමු.

(ඉ) 2022.08.08 දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම අත්හිටුවීම හේතුවෙන්, 2022 සහ 2023 දී තනතුරේ නිවාඩු යාම(VOP) , ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ මරණය හේතුවෙන් ඇති වූ පුරප්පාඩු පුරවා ඇත්තේ 2023.05.26 දිනැති යූජීසී /එච්.ආර් /10/01 ලිපියට අනුව ඩීඑම්එස් හි අනුමැතිය ඇතිව පමණි. කෙසේ වෙතත්, යූජීසී විසින් නියම කරන ලද පරිදි, 2019.12.25 දින සිට පුරවා නොමැති පුරප්පාඩු වූ පුස්තකාලයාධිපති තනතුර පිරවීම සඳහා ඩීඑම්එස් අනුමැතියක් ලබා දී නොමැත.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

වැලිව් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0009 1000 8188

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.06.27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. අබේවික්‍රම යන අය විසින් ලියා සහතික කරන ලද 2018 ජනවාරි මස 26 දාතම හා අංක 3267 දරන, 2020 ඔක්තෝබර් මස 13 දාතම හා අංක 4092 දරන, 2022 මාර්තු මස 21 දාතම හා අංක 4596 දරන සහ 2023 ජනවාරි මස 04 දාතම හා අංක 4824 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැලිව් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3267, 4092, 4596 සහ 4824 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් අට කෝටි විසි එක් ලක්ෂ අසූ දෙදහස් නවසිය පනස් එකයි ශත දහසයක (රු. 382,182,951.16) මුදලක්, 2023 ජුනි මස 13 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස් අට කෝටි විසි එක් ලක්ෂ අසූ දෙදහස් නවසිය පනස් එකයි ශත දහසයක (රු. 382,182,951.16) මුදල ද, 2023 ජුනි මස 14 දින සිට අංක 3267, 4092, 4596 සහ 4824 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි කෝටි හතළිස් දෙලක්ෂ හතළිස් අට දහස් නවයයි ශත විසි පහක (රු. 204,248,009.25) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Three Per centum (3%) per annum, හා තවත් රුපියල් හාර කෝටි තිස් දෙලක්ෂ හතළිස් අට දහස් දෙසිය හැත්තෑවයි ශත එකක (රු. 43,248,270.01) හා තවත් රුපියල් තුන් කෝටි අනූ ලක්ෂ හැට හතර දහසක (රු. 39,064,000.00) හා තවත් රුපියල් හය කෝටි හැට ලක්ෂ හතළිස් පන් දහසක (රු. 66,045,000.00) මුදලක් සඳහා වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3267, 4092, 4596 සහ 4824 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ, උඩපළාත පත්තුවේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ උඩපළාත ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පටිතලාව (අංක 1048 දරන ග්‍රා. නි. කො.) ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බෙරවිල්ල පිහිටි "ඉහුරුගල්ල එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. එස්.සංගරන්දෙනිය යන අය විසින් සාදන ලද 2018 පෙබරවාරි මස 18 දාතම හා අංක KY - 4014 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : දිය පාර, බලයලත් මානක තැන කේ. කුමාරසාමි යන අය විසින් සාදන ද අංක 8568 දරන පිඹුරේ ලොට් 7D, 7E, 7C, 8, 7F සහ 9; නැගෙනහිරට : අංක 8568 දරන පිඹුරේ ලොට් 7A, 7E සහ 7B, ගම්වාසීන් විසින් හිමිකම් කියන දවටගහමුලවත්ත සහ පඹේමඩ ඇළ; දකුණට : ගම්වාසීන් විසින් හිමිකම් කියන ගොන්නගහමුලවත්ත, ගම්වාසීන් විසින් හිමිකම් කියන දවටගහමුලවත්ත, අංක 8568 දරන පිඹුරේ ලොට් 7B සහ 7C සහ බස්නාහිරට : අංක 8568 දරන පිඹුරේ ලොට් 7D සහ දියපාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර තුන් සියයක් (අක්කර 300) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක KY-4014 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 63/139 යටතේ ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-17

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය.

2025 ජූලි මස 21 වැනි දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම් :-

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ජී. පී. චාමිනී ගුණවර්ධන විසින් සහතික කරන ලද 2021.10.13 දින අංක 637 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම අංක 29A, සංඝමිත්තා මාවත, කොළඹ 13 යන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක W9525 යටතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා සමග ලියාපදිංචි වී ඇත්තාවූ ද "මෙඩෝ ස්ටීල්ස්" යන නාමය, විලාසය සහ සංස්ථා නාමය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන "අයිසැක් රාජමනී (I වන ණය ගැණුම්කරු) යන අය විසින් සහ දයා පත්මා රාජමනී (II වන ණය ගැණුම්කරු) යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති චංචල දේපළෙහි/ වාහනයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරු I ණය ගැණුම්කරු විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී අංක 637 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2025 මැයි මස 08 දින වනවිට ඉහත කී අංක 637 දරන උකස් බැඳුම්කරය මත බැංකුව වෙත රුපියල් මිලියන විසි එකයි නවලක්ෂ දස දහස් හයසිය දාහතරයි ශත අනූ හතක් වූ (රු. 21,910,614.97) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදු කර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන විසිඑකයි නවලක්ෂ දසදහස් හයසිය දාහතරයි ශත අනූ හතක් වූ (රු. 21,910,614.97) මුදල හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ ඉහත කී අංක 637 දරන උකස් බැඳුම්කරය සම්බන්ධයෙන් වන විට 2025 මැයි මස 09 වැනි දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට තිහයි දශම බිංදුවයි පහක් වූ (30.05%) අනුපාතිකය යටතේ එම උකස් බැඳුම්කරය මගින් ඇපයෙන් සුරක්ෂිත කරන ලද රුපියල් මිලියන දහතුනයි හයලක්ෂ විසි එක් දහස් හයසිය හැත්තෑ පහයි ශත අනූ තුනක් වූ (රු. 13,621,675.93) මූලික මුදල මත පොළිය ද, අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී ණය මුදල්/ පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස් කරන ලද පහත සවිස්තරාත්මකව විස්තර කර ඇති චංචල දේපළෙහි/ වාහන දේපළෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය සහ වෙනත් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුළත් වන එම චංචල දේපළ/ වාහන දේපළ බලයලත් වෙන්දේසිකාර නිශාන්ත උපුල් ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (ප්‍රධාන පනත යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

**පළමු උපලේඛනය**

කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල කොට්ඨාසය ඇතුළත, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කොටහේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ 13, අල්විස් පෙදෙස, අංක 9/1 දරන පරිශ්‍රයේ තබා ඇති හෝ ගබඩාකර ඇති එක්ව හා වෙන් වෙන්ව වූ චංචල දේපළ/ වාහන දේපළ වේ.

| *විස්තරය* | *ටොයෝටා මෝටර් රථය* |
|---|---|
| වර්ගය හා මාදිලිය | ටොයෝටා DEA-NZT260-ප්‍රිමියෝ |
| චැසි අංකය | NZT260-3148412 |
| එංජින් අංකය | INZ-E699190 |
| නිෂ්පාදිත වර්ෂය | 2014 |
| වර්ණය | පර්ල් වයිට් |
| ලියාපදිංචි කිරීමේ අංකය | WP-CAA-6347 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10-12

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

බියෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 5123 1000 0028

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2021 ජනවාරි මස 27 දාතම හා අංක 5207, 5209 සහ 5211 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 9743 දරන ශ්‍රී ලංකා සමාගම් නීතිත් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක්වන බියෝ ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ වගන්ති 244 (1) (A) ප්‍රකාරව සීමාසහිත වගකීම් සහිත සමාගමකට නිකුත් කරනු ලබන ඒකාබද්ධ සහතිකයක් දරන, ඉකෝ ප්ලැනට් ප්‍රයිවට් ලිමිටඩ්, සීතවැලි, බයෝඩයිනමික් ප්‍රයිවට් ලිමිටඩ් සහ හර්බල් හෙරිටේජ් ප්‍රයිවට් ලිමිටඩ් ඒකාබද්ධයෙන් ප්‍රතිඵලයක් වශයෙන් එකී බියෝ ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 5207, 5209 සහ 5211 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද වලංගු මුදලින් ඇමෙරිකානු ඩොලර් පහළොස් ලක්ෂ හැට එක් දහස් අටසිය අසූ අටයි ශත තුනක (USD 1,561,888.03) මුදලක් 2025 අප්‍රේල් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් ඇමෙරිකානු ඩොලර් පහළොස් ලක්ෂ හැට එක් දහස් අටසිය අසූ අටයි ශත තුනක (USD 1,561,888.03) මුදල ද, 2025 අප්‍රේල් මස 08 දින සිට අංක 5207, 5209 සහ 5211 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් ඇමෙරිකා එක්සත් ජනපද වලංගු මුදලින් ඇමෙරිකානු ඩොලර් දොළොස් ලක්ෂ හැට හය දහස් හත්සිය අසූ හතරයි ශත හතළිස් එකක (USD 1,266,784.41) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of 3 months London Inter Bank Offrced Rate + Five Decimal Naught per centum (3 Months LIBOR + 5.0% p.a.) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 5207, 5209 සහ 5211 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ උතුර වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "සුදගලයාය, ඉහළ කටුපොතහේන සහ වෙලගාව හේන එකිනෙකට යාබදව *නොහොත්* පන්නම්පිටිය කුඹුර සහ උස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පී. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2020 ඔක්තෝබර් මස 02 දාතම හා අංක 5818 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : බියෝ ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ එම්. වයි. එම්. නිසාබ්ඩීන් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්; නැගෙනහිරට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : ජගත් සේනානායක විසින් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සක් (අක්.1, රූඩ්.03, පර්. 20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5818 දරන පිඹුරට අනුව ය.

අංක 5818 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ උතුර වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "සුදුගලයාය, ඉහළ කටුපොතහේන සහ වෙලගාව හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. එන්. කාදර් යන අය විසින් සාදන ලද 2006 මාර්තු මස 12 දාතම හා අංක 253/06/P දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අගල (අඩි 8 පළල පාර); නැගෙනහිරට : මාතලේ දඹුල්ල ප්‍රධාන පාර; දකුණට : ප්‍රධාන පාරේ සිට ගම දක්වා පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විස්සක් (අ.1, රූඩ්.3, පර්.20) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 253/06/P දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව L 24/124 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

| No. | Description (Machineries at Plan No. 5818) | Number of Machines |
|---|---|---|
| 1 | Metal Detector with Inspection Conveyer (Type 10) | 1 |
| 2 | Metal Detector with Inspection Conveyer with Accessories (Type 02) | 1 |
| 3 | Metal Detector with Inspection Conveyer with Accessories (Type 03) | 1 |
| 4 | Vaccum Machine (Type 01) | 1 |
| 5 | Blending Machine | 1 |
| 6 | Retort – 01 | 1 |
| 7 | Retort – 02 | 1 |
| 8 | Steam Dryer | 1 |
| 9 | Surface Dryer | 1 |
| 10 | Vaccum Machine | 1 |
| 11 | R & D Machine with Accessories | 1 |
| 12 | Shifter Machine | 1 |
| 13 | Sorting Table with Accessories | 3 |
| 14 | De Stoning Unit | 1 |
| 15 | Pepper Cleaning System with Accessories | 1 |
| 16 | Retort – 03 | 1 |
| 17 | White Pepper Washer | 1 |
| 18 | Shrink Wrapping Machine | 2 |
| 19 | Strapping Machine | 2 |
| 20 | Nut Meg Dryer | 1 |
| 21 | Air Compressor with Accessories | 1 |
| 22 | Air Conditioner (60000 Btu) | 2 |
| 23 | Air Conditioner (50000 Btu) | 1 |
| 24 | Dryer with Accessories | 1 |
| 25 | Weight Filling Machine | 1 |
| 26 | Generator (SDG 125S) | 1 |

(උකස් බැඳුම්කර අංක 5207 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ (උතුර) වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "ඉහළ කටුපොත කුඹුර දැන් වත්ත, ඉහළ කටුපොතහේන, සුදුගල යාය, වෙලගාව හේන සහ වැටගාව හේන දැන් එක දේපළක් නිර්මාණය වන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පී. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2020 නොවැම්බර් මස 07 දාතම හා අංක 5862 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : පාර (ප්‍රාදේශීය සභා) ; නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක්, එම්. වයි. එම්. ඒ. හලීම් විසින් හිමිකම් කියන ඉඩම; දකුණට : ඇළ (අත්හල) සහ බස්නාහිරට: ඇළ (අත්හල) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතක් (රූඩ් 2, පර්. 7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 5862 දරන පිඹුරට අනුව ය.

අංක 5862 දරන පිඹුරේ එකී ලොට් 01 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ (උතුර) වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "සුදුගලයාය, ඉහළ කටුපොතහේන සහ වෙලගාව හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පී. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2013 ජූනි මස 15 දාතම හා අංක 3910 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (අඩි 15 පළල පාර); නැගෙනහිරට : එම්. වයි. එම්. ඒ. හලීම් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක්; දකුණට සහ බස්නාහිරට : ඇළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතක් (රූ.2, පර්. 7) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 3910 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව L 13/123 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

| No. | Description (Machineries at Plan No. 5862) | Number of Machines |
|---|---|---|
| 1 | Dehumidifiers (Dry Air : FFB-600) | 1 |
| 2 | Hair/ Fiber Removing Machine | 1 |
| 3 | Cutting Machine | 2 |
| 4 | Retort | 1 |

| *No.* | *Description (Machineries at Plan No. 5862)* | *Number of Machines* |
|---|---|---|
| 5 | Dryer 01 | 1 |
| 6 | Dryer 02 | 1 |
| 7 | Indian Mill | 1 |
| 8 | Pulvarizer 01 | 1 |
| 9 | Double Pulvarizer | 1 |
| 10 | Vibro Machine | 1 |
| 11 | Metal Detector (Type 01) | 1 |
| 12 | Metal Detector (Type 02) | 1 |
| 13 | Metal Detector (Type 03) | 1 |
| 14 | Exhaust Fan with Accessories | 2 |
| 15 | Air Conditioner (36000 Btu) | 1 |
| 16 | Air Conditioner (24000 Btu) | 2 |

උකස් බැඳුම්කර අංක 5209 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

3. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ (උතුර) වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "සුදුගල යාය, ඉහළ කටුපොතහේන, වෙලගාව හේන *නොහොත්* පන්නම්පිටිය කුඹුර සහ උස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. පී. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2020 නොවැම්බර් මස 07 දාතම හා අංක 5861 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට : ඇළ (අත්හල); දකුණට : ඇළ (අත්හල) බස්නාහිරට : ගම්වාසීන් හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් පහක් (අ.2, රූ.3, පර්. 5) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5861 දරන පිඹුරට අනුව ය.

අංක 5861 දරන පිඹුරේ එකී ලොට් 01 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මාතලේ (උතුර) වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පන්නම්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ - පන්නම්පිටිය - ලෙනදොර ග්‍රාමයේ පිහිටි "සුදුගල යාය, ඉහළ කටුපොතහේන, වෙලගාව හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ජයසේකර යන අය විසින් සාදන ලද 2000 පෙබරවාරි මස 25 දාතම හා අංක 9422 දරන පිඹුරේ සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : බලයලත් මානක තැන ජේ. එම්. ජයසේකර යන අය විසින් සාදන ලද අංක 8438 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ ඉතිරි කොටස; ගිණිකොනට : මාර්ග පිවිසුම (අඩි 15 පළල) වෙත දිවෙන ඇළ වෙන්කිරීම; නිරිතට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් දොළහක් (අ.2, රූඩ්.3, පර්. 12) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 9422 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව L 13/122 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

| *No.* | *Description (Machineries at Plan No. 5861)* | *Number of Machines* |
|---|---|---|
| 1 | Sorting Belt | 2 |
| 2 | S S Washing Tank | 1 |
| 3 | Washing and Peeling Machine | 1 |
| 4 | Spinner Machine | 2 |
| 5 | Cool Room with Accessories (Type 01) | 1 |
| 6 | Lemon Grass Cutting Machine | 1 |
| 7 | Chopping Machine | 1 |
| 8 | S S Moisture Tap | 1 |
| 9 | Counties Ginger Washing Line | 1 |
| 10 | Dyser Machine | 1 |
| 11 | Slicer Machine (Type 01) | 1 |
| 12 | Steam Balancing Machine with Accessories | 1 |
| 13 | Cooker & Cooking Unit | 1 |
| 14 | Slicer Machine (Type 02) | 1 |
| 15 | Air Conditioner (48000 Btu) | 2 |
| 16 | Milling Machine with Accessories | 1 |
| 17 | S S Hopper | 1 |
| 18 | IQF Machine (Cryo-Quick_) with Accessories | 1 |

| *No.* | *Description (Machineries at Plan No. 5861)* | *Number of Machines* |
|---|---|---|
| 19 | IQF Machine (Octo Forest) with Accessories | 1 |
| 20 | Metal Detector with Conveyer | 1 |
| 21 | Air Conditioner (48000 Btu) | 4 |
| 22 | Inkjet Printer (Domino A120) | 1 |
| 23 | Tea Cube Machine | 1 |
| 24 | Sealer Machine | 1 |
| 25 | Refrigerated Containers | 2 |
| 26 | Blast Frezer with Accessories | 1 |
| 27 | Cool Room with Accessories (Type 02) | 1 |
| 28 | Cool Room with Accessories (Type 03) | 1 |
| 29 | Air Compressor with Accessories | 1 |
| 30 | Oxygen Sensor | 3 |
| 31 | Alpine Milling Machine with Accessories | 1 |
| 32 | Milling Machine | 3 |
| 33 | Vibro Seirve with Accessories 01 | 1 |
| 34 | Vibro Seive with Accessories 02 | 1 |
| 35 | SS Blender Machine | 1 |
| 36 | Metal Detector with Conveyer | 1 |
| 37 | Air Conditioners System with Accessories | 1 |
| 38 | Washing Line with Accessories | 1 |
| 39 | Spinner Machine (Type 10) | 1 |
| 40 | Spinner Machine (Type 02) | 1 |
| 41 | Trough with Accessories | 1 |
| 42 | Combine Trough with Accessories | 2 |
| 43 | Herbal Processing Plant | 1 |
| 44 | Wood Cutting Band Saw | 1 |
| 45 | Wood Cutting Band Saw | 1 |
| 46 | Air Conditioner (64000 Btu) | 1 |
| 47 | Air Conditioner (24000 Btu) | 1 |
| 48 | Boiler (JIL KS : KS 100) with Accessories | 1 |
| 49 | Generator (Perkins – P450) | 1 |

(උකස් බැඳුම්කර අංක 5211 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-41

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එම්. ආර්. ඩී. එස්. ප්‍රනාන්දු
ගිණුම් අංකය : 0024 5002 2783

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන විසින් ලියා සහතික කරන ලද 2013 ඔක්තෝබර් මස 22 දාතම හා අංක 121, 2016 සැප්තැම්බර් මස 19 දාතම හා අංක 3148 දරන සහ 2016 නොවැම්බර් මස 28 දාතම හා අංක 3298 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. සී. ලක්මිණි විසින් ලියා සහතික කරන ලද 2019 ජුලි මස 27 දාතම හා අංක 973 දරන උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාරවලගේ රුවින් දිල්රුක් ශාන්ත ප්‍රනාන්දු බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන විසින් ලියා සහතික කරන ලද 2018 ජුනි මස 07 දාතම හා අංක 2288 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මාරවලගේ රුවින් දිල්රුක් ශාන්ත ප්‍රනාන්දු සහ මාරවිලගේ රවිඳු තිලංක යන අය බන්ධනදායි වශයෙන් හා මාරවලගේ රුවින් දිල්රුක් ශාන්ත ප්‍රනාන්දු උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 121, 3148, 3298, 973 සහ 2288 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහසය කෝටි පනස් හතර ලක්ෂ පනස් තුන් දහස් අටසිය පනස් එකයි ශත තිස් පහක (රු. 165,453,851.35) මුදලක් 2025 අප්‍රේල් මස 08 වැනි දිනට එකී අංක 121, 3148, 3298, 973 සහ 2288 දරන උකස් බැඳුම්කර ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහසය කෝටි පනස් හතර ලක්ෂ පනස් තුන් දහස් අටසිය පනස් එකයි ශත තිස් පහක (රු. 165,453,851.35) මුදල ද, 2025 අප්‍රේල් මස 09 වැනි දින සිට අංක 121, 3148, 3298, 973 සහ 2288 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන් කෝටි අට ලක්ෂ අනූ නව දහස් හත්සිය අසූ දෙකයි ශත විසි තුනක (රු. 50,899,782.23) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) හා තවත් රුපියල් එක් කෝටි විසි එක් ලක්ෂ විසි හය දහසක (රු. 12,126,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම බිංදුවක් (16.0%) හා තවත් රුපියල් හය කෝටි තිස් අට ලක්ෂ පනස් තුන් දහස් දෙසිය හැත්තෑ දෙකයි ශත විසි හයක (රු. 63,853,272.26) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහයි දශම අටක් (5.8%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2328, 121, 3148, 3298, 973 සහ 2288 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ හි කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පළහතුරේ, අංක 75A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පළහතුරේ නැගෙනහිර පිහිටි පළහතුරේ පාර, වරිපනම් අංක 80 දරන "දවටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩී. ජී. සී. ගුණසේකර විසින් සාදන ලද 1995 නොවැම්බර් මස 20 දාතම හා අංක 851 දරන පිඹුරේ සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කැලිස්ටස් ප්‍රනාන්දුගේ ඉඩම සහ පාර (නගර සභා); නැගෙනහිරට : පාර (නගර සභා); දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : මියගිය රොමානිස් ජයවර්ධනගේ උරුමක්කාරයින්ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි නවයයි දශම එකයි පහක් (පර්. 29.15) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 851 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 56/35 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 121 සහ 3148 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පළහතුරේ අංක 75A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පළහතුරේ පිහිටි කට්ටුව දුම්රියපල පාර, වරිපනම් අංක 113 දරන "කොන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් යන අය විසින් සාදන ලද 2015 අප්‍රේල් මස 20 දාතම හා අංක 5652A (වඩා නිවැරදිව 5652P) දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ කොටසක්; නැගෙනහිරට : කට්ටුව දුම්රියපළ පාර; දකුණට : ගෝල්ඩ් සැන්ස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : ඩී. එස්. ජයවර්ධන විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් බිංදුවයි හතරයි දශම බිංදුවයි බිංදුවක් (රූ.1, පර්. 4.00) විශාල ඉම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5652A දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරු G 133/155 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3298, 2288 සහ 973 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-52

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මහරගම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : ජීබීසී එන්ටර්ප්‍රයිසස් හි හවුල්කරුවන් වන ගොයිගම බුලත්ගේ චන්ද්‍රසෝම, කපිල ගොයිගම බුලත්ගේ, නිලංකා ගොයිගම බුලත්ගේ සහ වර්ණසූරිය පටබැඳිගේ ප්‍රේමවතී

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි දැක්වෙන යෝජනාව වර්ෂ 2025 ක් වූ ජූලි මස 31 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී ජීබීසී එන්ටර්ප්‍රයිසස් හි හවුල්කරුවන් වන ගොයිගම බුලත්ගේ චන්ද්‍රසෝම, කපිල ගොයිගම බුලත්ගේ, නිලංකා ගොයිගම බුලත්ගේ සහ වර්ණසූරිය පටබැඳිගේ ප්‍රේමවතී යන අය "බන්ධනදායී/ උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරිආරච්චි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020.01.28 වැනි දිනැති අංක 1526 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2020.07.08 වැනි දිනැති අංක 1570 දරන ද්විතියික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1526 සහ 1570 දරන උකස්කරයන් මත,

01. වර්ෂ 2025.06.02 වැනි දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දෙසිය දහ තුන් ලක්ෂ විසි තුන් දහස් හාරසිය හතරයි ශත හැට පහක (රු. 21,323,404.65) මුදලක් සහ වර්ෂ 2025.06.03 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් දෙසිය හය ලක්ෂ හතළිස් හතර දහස් හත්සිය හැත්තෑ අටයි ශත අනූ අටක් (රු. 20,644,778.98)ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 14.50% ක පොළිය ද;

02. වර්ෂ 2025.06.02 වැනි දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පහළොස් ලක්ෂ අනූ තුන් දහස් පන්සිය හතළිහයි ශත අනූ දෙකක (රු. 1,593,540.92) මුදලක් සහ වර්ෂ 2025.06.03 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් පහළොස් ලක්ෂ තිස් හතර දහස් පන්සිය එකයි ශත පනස් හතක් (රු. 1,534,501.57) දක්වා වූ මුදල මත වර්ෂයකට 14.50% ක පොළිය ද;

03. වර්ෂ 2025.06.02 වැනි දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දස ලක්ෂ තිස් එක් දහස් පන්සිය පනස් පහයි ශත අසූ පහක (රු. 1,031,555.85) මුදලක් සහ වර්ෂ 2025.06.03 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් නව ලක්ෂ හැට නව දහස් එකසිය තිස් හතයි ශත දහඅටක් (රු. 969,137.18) දක්වා වූ මුදල මත වර්ෂයකට 14.50% ක පොළිය ද;

04. වර්ෂ 2025.05.31 වැනි දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකසිය පනස් පන් ලක්ෂ පනස් නව දහස් දාහතරයි ශත විසි අටක (රු. 15,559,014.28) මුදලක් සහ වර්ෂ 2025.06.01 වැනි දින සිට රු. මිලියන 15.0ක මුදල දක්වා වාර්ෂිකව 12.50% බැගින් පොළිය ද, රු. මිලියන 15.0 ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 30% බැගින් පොළිය ද;

ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු සම්පූර්ණ මුදලවන රුපියල් තුන්සිය අනූ පන් ලක්ෂ හත් දහස් පන්සිය පහළොවයි ශත හැත්තෑවක (රු. 39,507,515.70) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 532ඒ, ගොඩිගමුව දකුණ

ග්‍රාම නිලධාරි කොට්ටාසයේ ගොඩිගමුව පිහිටි පිළියන්දල පාර (වම), වරිපනම් අංක 165 සහ 167 දරන "පනුගලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. කේ. ටී. බද්දේවිතාන විසින් මැන සාදන ලද වර්ෂ 2017.08.12 දිනැති අංක 3458 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් මැන සාදන ලද වර්ෂ 2012.12.16 දිනැති අංක 11927 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 දරන ඉඩමෙහි නැවත මැනීමකි). දැක්වෙන "ලොට් A" දරන ඉඩමට මායිම් වූ, උතුරට : ඉහත කී පිඹුරු අංක 11927 හි ලොට් 9 (අඩි 10ක් පළල පාර) ද; නැගෙනහිරට : එස්. කේ. සමරතුංගට අයිති ඉඩම ද; දකුණට : ඉහත කී පිඹුරු අංක 11927 හි ලොට් 1 ද; බස්නාහිරට : මහරගම - පිළියන්දල ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම එකයි පහක් (පර්. 12.15) විශාලත්වය ඇති ඉඩමෙහි භූමිය, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දේද වේ.

තව ද ඉහත කී ලොට් A දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, ගොඩිගමුව පිහිටි "පනුගලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් මැන සාදන ලද වර්ෂ 2012.12.16 දිනැති අංක 11927 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු ජේ. රොද්‍රිගෝ විසින් මැන සාදන ලද වර්ෂ 1928.11.01 දිනැති අංක 2619 දරන පිඹුරේ දැක්වෙන ලොට් F2 හි කොටසක් වන ලොට් E දරන ඉඩම් කොටස් ඒකාබද්ධ කොට බෙදා වෙන් කිරීමකි.) දැක්වෙන "ලොට් 2" දරන ඉඩමට මායිම් ව උතුරට : මෙහි ම ලොට් 9 (අඩි 10ක් පළල පාර) ද; නැගෙනහිරට: එස්. කේ.සමරතුංගට අයිති ඉඩම ද; දකුණට : මෙහි ම ලොට් 1 ද; බස්නාහිරට : මහරගම - පිළියන්දල ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම තුනක් (පර්. 12.3) *හෙවත්* හෙක්ටයාර 0.0311 විශාලත්වය ඇති ඉඩමෙහි භූමිය, ගොඩනැගිලි, ගහකොළෙ, වැවිලි සහ එහි පිහිටි සියලු දේ ද වේ.

තව ද පහත දැක්වෙන ඉඩම මතින්වන මාර්ග පරවශතාවය ද වේ.

බස්නාහිර පළාතේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, ගොඩිගමුව පිහිටි "පනුගලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් මැන සාදන ලද වර්ෂ 2012.12.16 දිනැති අංක 11927 දරන පිඹුරේ දැක්වෙන "ලොට් 9" (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කරන ලද) දරන ඉඩමට මායිම් වූ උතුරට : ලොට් 3, 5, 6, 7 සහ 8 ද; නැගෙනහිරට : පිඹුරු අංක 2985 හි ලොට් X හි ඉතිරි කොටස ද; දකුණට : පිඹුරු අංක 2985 හි ලොට් X සහ කේ. සමරතුංගට අයිති ඉඩම සහ මෙහි ම ලොට් 2 ද; බස්නාහිරට: මහරගම - පිළියන්දල ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටක් (පර්. 8) විශාලත්වය ඇති ඉඩමෙහි භූමිය, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
කළමනාකරු - ණය අයකර ගැනීම්.

10-55

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පුත්තලම ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණයදෙනුකරුගේ නම : මීපුර රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2025 ක් වූ ජුනි මස 26 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී මීපුර රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය "බන්ධනදායී" සහ නදීෂා සමින්දි කුරුප්පු නානායක්කාර යන අය "උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. එන්. චන්දිමා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2019.12.10 වැනි දිනැති අංක 867 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 867 දරන උකස්කරය මත,

01. වර්ෂ 2025.05.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් විසි හත් මිලියන එක් ලක්ෂ විසි නව දහස් එකසිය විසි දෙකයි ශත හැත්තෑ අටක (රු. 27,129,122.78) මුදලක් සහ වර්ෂ 2025.05.19 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් පහළොස් මිලියන හත් ලක්ෂ තිස් හය දහස් දෙසිය තිස්

හයයි ශත එකක් (රු. 15,736,236.01) දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද; සහ

02. වර්ෂ 2025.05.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් තුන් මිලියන දෙලක්ෂ හැත්තෑ පන් දහස් දෙසිය පනස් දෙකයි ශත තිස් හතක (රු. 3,275,252.37) මුදලක් සහ වර්ෂ 2025.05.19 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමවන තුරු රුපියල් දෙමිලියන දෙලක්ෂ දහ දහස් එකසිය අසූ හතරයි ශත විසි නවයක් (රු. 2,210,184.29) දක්වා වූ මුදල මත වර්ෂයකට 22%ක පොළිය ද, ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද;

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් තිස් මිලියන හාර ලක්ෂ හාර දහස් තුන්සිය හැත්තෑ පහයි ශත පහළොවක (රු. 30,405,374.15) මුළු මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුහේන්පිට දකුණ, අංක 266 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වරිපනම් අංක 51/06, කොළඹ පාරෙහි වම්පස, තලවතුහේන්පිට (දකුණ) ගමෙහි පිහිටි "මිල්ලගහවත්ත සහ මිල්ලගහවත්තේ මැදකොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ආර්. පී. එම්. සේනානි පෙරේරා විසින් මැන සාදන ලද වර්ෂ 2019.05.25 දිනැති අංක 556/2019 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් මැන සාදන ලද 2008.01.16 දිනැති අංක 24/2008 දරන පිඹුරේ ලොට් 3A හි දැක්වෙන ඉඩම නැවත මැනීමකි) දැක්වෙන "ලොට් X" දරන ඉඩමට මායිම් : උතුරින් : "කැන්ඩි" රෙදිපිළි දේපළ සහ අශෝක පෙරේරාට අයිති ඉඩම ද; නැගෙනහිරින්: අශෝක පෙරේරාට අයිති ඉඩම සහ අඩි 10ක් පළල පාර ද; දකුණට : අඩි 10ක් පළල පාර සහ එච්. එන්. කේ. නානායක්කාරට අයිති ඉඩම ද සහ බස්නාහිරට: එච්. එන්. කේ. නානායක්කාරට සහ අයි. කබ්රාල්ට අයිති ඉඩම ද මායිම් වූ එකී අංක 556/2019 දරන පිඹුරෙහි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම දෙකයි පහක් (පර්. 9.25) හෝ හෙක්ටයාර් 0.0234ක විශාලත්වය ඇති ඉඩමෙහි භූමිය, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දේද වේ.

ලොට් X පහත ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයේ), ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, (දලුගම උප කාර්යාල සීමාව) කැලණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුහේන්පිට (දකුණ) ගමෙහි පිහිටි "මිල්ලගහවත්ත සහ මිල්ලගහවත්තේ මැදකොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් මැන සාදන ලද 2008.01.16 දිනැති අංක 24/2008 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 2006.05.09 දිනැති අංක 516A/2006 දරන පිඹුරේ ලොට් 3හි දැක්වෙන ඉඩම නැවත මැනීමකි) දැක්වෙන "ලොට් 3A" දරන ඉඩමට මායිම් උතුරින් : අංක 516A/2006 පිඹුරේ දැක්වෙන ලොට් 2, අනුෂා මෙමා වෙළඳ සංකීර්ණයට අයිති දේපළ සහ අශෝක පෙරේරාට අයිති ඉඩම ද; නැගෙනහිරින් : අශෝක පෙරේරාට අයිති ඉඩම සහ අඩි 10ක් පළල පාර ද; දකුණට : අඩි 10ක් පළල පාර සහ මෙහිම ලොට් 3B ද සහ බස්නාහිරට : මෙහි ම ලොට් 3B සහ අංක 516A/2006 පිඹුරේ දැක්වෙන ලොට් 2 ද මායිම් වූ එකී අංක 24/2008 දරන පිඹුරෙහි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම දෙකයි පහක් (පර්. 9.25) හෝ හෙක්ටයාර් 0.0234ක විශාලත්වය ඇති ඉඩමෙහි භූමිය, ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ එහි පිහිටි සියලු දේද වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත විස්තර කරන ඉඩම සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිය ඇතුළුව සියලු පරවශාතා අයිතීන් ද සමග වේ.

ඉහත කී දකුණු තලවතුහේන්පිට පිහිටා ඇති "මිල්ලගහවත්ත හා මිල්ලගහවත්තේ මැදකොටස" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද 2006.05.09 දිනැති අංක 516A/2006 දරන පිඹුරෙහි (මාර්ගය සඳහා වෙන් කිරීමක්) දැක්වෙන ලොට් 5 දරන ඉඩමට මායිම් : උතුරින් : අශෝක පෙරේරාට අයිති ඉඩම ද; නැගෙනහිරින් : ලොට් 6 ද; දකුණට : පාර ද සහ බස්නාහිරට : මෙහි ම ලොට් 3 සහ 4 ද යන මායිම් වූ එකී අංක 516A/2006 දරන පිඹුරෙහි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම දෙකක් (පර්. 7.2) හෝ හෙක්ටයාර් 0.0182ක විශාලත්වය ඇති ඉඩම.

ඉහත සඳහන් කළ 516A/2006 සැළැස්මේ දැක්වෙන කොළඹ නුවර පාරට පිවිසෙන ලොට් 5හි දකුණු මායිමේ පිහිටා ඇති මාර්ග රක්ෂිතය තුළින්, මතින්, ඔස්සේ සහ දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අරුණ ගුරුගේ,
කළමනාකරු - ණය අයකර ගැනීම.

10-56

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කඩවත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : සෙන්සර් ලංකා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 28 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී සෙන්සර් ලංකා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම "බන්ධනදායී සමාගම" ලෙස ද සූරිය ආරච්චිගේ ප්‍රියන්ත සංජීව සූරියාරච්චි (බන්ධනදායී සමාගමේ අධ්‍යක්ෂ) යන අය "උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2021.03.05 දිනැති අංක 834 දරන ප්‍රාථමික උකස්කරය, වර්ෂ 2023.01.04 දිනැති අංක 1080 දරන ද්විතීයික උකස්කරය, වර්ෂ 2023.03.03 දිනැති අංක 1090 දරන තෘතීයික උකස්කරය සහ වර්ෂ 2024.11.21 දිනැති අංක 1417 දරන චාතුර්ථික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 834, 1080, 1090 සහ 1417 දරන උකස්කරයන් මත -

(අ) වර්ෂ 2025.07.03 දින වනවිට මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හැත්තෑ හය ලක්ෂ හැත්තෑ පන් දහස් නවසිය අනූවයි ශත පනස් හතක (රු. 7,675,990.57) මුදලක් ද, වර්ෂ 2025.07.04 වැනි දින සිට රු. 7,384,229.51ක් දක්වා වූ මුදල මත වර්ෂයකට 16%ක පොළිය ද;

(ආ) රුපියල් මිලියනයක (රු. 1,000,000.00) සහ රුපියල් දහහත් ලක්ෂ අනූ දහසක (රු. 1,790,000.00) වටිනාකමකින් යුතු බැංකු ඇපකර පහසුකම් මත පවතින නිශ්චය නොකළ වගකීමේ බැදියාව මත අයවිය යුතු මුදල් ද,

ඉහත කී බන්ධනදායී/ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

ඒ කෙසේ ද යත්, ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑ හය ලක්ෂ හැත්තෑ පන් දහස් නවසිය අනූවයි ශත පනස් හතක (රු. 7,675,990.57)ක මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) ඉහත කී රුපියල් මිලියන 1.00ක සහ රුපියල් මිලියන 1.790ක බැංකු ඇපකර මත පවතින බන්ධනයට යටත්ව අයවිය යුතු මුදලක් වේනොත් එම මුදල ද, අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරගොල්ල දකුණ - 216 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හොරගොල්ල ගමෙහි පිහිටි, පද්මපෙරුම මාවතේ, වරිපනම් අංක 18පීපීඑම්0015/01 දරන කැටකැලගහවත්ත නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. එන්. සඳගිරි විසින් සම්පාදිත 2008.11.08 (වඩා නිවැරදිව 2018.09.16) දිනැති අංක 3803 දරන පිඹුරේ ලොට් 1 (බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සම්පාදිත 1984.07.20 දිනැති අංක 1413 දරන පිඹුරේ දැක්වෙන ඉඩම නැවත මැනීමක් වන) ලෙස දැක්වෙන, උතුරින් : පාර (අඩි 6ක් පළල) සහ පාර (අඩි 12ක් පළල) ද; නැගෙනහිරින්: නොයෙල් රාජපක්ෂ අයිතිවාසිකම් කියන ඉඩම ද; දකුණින් : එස්. එන්ගල්තිනා අයිතිවාසිකම් කියන ඉඩම සහ පාර (අඩි 6ක් පළල) සහ බස්නාහිරින් : පාර (අඩි 5ක් පළල) මායිම් වූ එකී පිඹුරු අංක 3803 හි දැක්වෙන පරිදි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ අනිකුත් සියලු දෙය වේ.

ඉහත කී අංක 3803 දරන පිඹුරෙහි දැක්වෙන මාර්ගය මතින් සහ ඒ ඔස්සේ වන මාර්ග අයිතිය ඇතුලුව සියලු පරවශතා අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. එල්. හල්වතුර,<br>ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී,<br>ණය අයකර ගැනීම්.

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2025.12.05 | සිකුරාදා | 2025.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.12 | සිකුරාදා | 2025.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.19 | සිකුරාදා | 2025.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.12.26 | සිකුරාදා | 2025.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.